## *4. ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු*

---

### 4.1 විගණන විෂය පථය

---

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණ

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණය

සහ පහත 4.4 සිට 4.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-----------------

(i) වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.2,580,000 ක මුලු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු. 10,287,604 ක් වූ අතර එය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 81 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------------

විෂය අංක 04011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂ වල එකතුව රු.291,826 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**4.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**4.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා**

-----------------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ

යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල  කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ජූනි 19 දින දීය.

### 4.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

-------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.5 කාර්ය සාධනය

-----------------

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලය විසින්  2012 ජනවාරි 01 දින වන විට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 2937 ක් වූ අතර,  2012 වර්ෂයේදී අලුතින් ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව 2018 ක් වූයෙන්, 2012 වර්ෂයේදී විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 4955 ක් විය. මෙම නඩු සංඛ්‍යාවෙන් වර්ෂය තුළ නඩු 1562 ක් අවසන් කර තිබූ අතර, 2012 දෙසැම්බර් 31 දින වන විට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 3393 ක් විය.

### 4.6 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 06 | 01 | - |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 07 | - | 04 |
| (ඇ) | ද්විතියික මට්ටම | 119 | 131 | - | 12 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 91 | 123 | - | 32 |
| (ඉ) | වෙනත් (අනියම්, තාවකාලික පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 220 | 269 | 01 | 50 |

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.